# ඉන්දියා ඉතිහාසය

## 5.1 මගධ අධිරාජ්‍යයේ ප්‍රභවය හා ව්‍යාප්තිය



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

## මගධ අධිරාජ්‍යයේ ප්‍රභවය හා ව්‍යාප්තිය

*හැඳින්වීම*

සොළොස් මහා ජනපද අතර මගධය හා කෝසලය වැදගත් විය.

කෘෂිකාර්මික කර්මාන්ත හා වෙළඳාම දියුණු වෙමින් එන සමාජයක ගෝත්‍රික බැඳීම් හා ගෝත්‍රික සම්ප්‍රදායන් වැදගත් නොවී ය.අවශ්‍ය ව තිබුණේ ගංගා යමුනා නදී නිම්න සිසාරා පැතිර යන දේශපාලන තන්ත්‍රයකි.එවැනි අවශ්‍යතාවක් යථාර්ථයක් බවට පත් කළ හැකි ශක්තිය තිබුනේ **කෝසල , මගධ** යන රාජාණ්ඩු දෙකට පමණි.මේ රජ පවුල් දෙක ම ක්ෂත්‍රිය සම්භවයක් නොතිබුණු ඒවා හෙයින් රජවරුන්ගේ කටයුතු පාලනය කිරීමට සභා හෝ සමිති වැනි ගෝත්‍රික සංවිධාන ද නොවී ය.

මුල් ජනපද යුගයේ දී මගධය අභිභවා කෝසල ජනපදය බලවත් විය.මුල් යුගයේ දී කෝසල ජනපදය බලවත් වීමට හේතු ගණනාවකි.

**මේ රාජාණ්ඩු දෙකෙන් වඩාත් ප්‍රබල හා පැරණි ම වූයේ කෝසලය යි.**

**පුරාණයේ දී එහි අගනුවර වූ සාකේත හෙවත් අයෝධ්‍යාව රාමගේ ජන්ම භූමිය ලෙස හින්දූහු සලකති. ක්‍රි.පූ. 6 වන ශත වර්ෂය වන විට අගනුවර ශ්‍රාවස්තියට මාරු වී තිබුණි.**

**කෝසලට ගංගා නදියේ පාලනය ලබා ගත හැකි වූයේ දීර්ඝකාලීන සටන් රාශියකින් අනතුරු ව කාසි රාජ්‍යය ඈඳා ගැනීමෙන් පසුවයි.**

**බෞද්ධ සාහිත්‍යට අනුව එය ලැබුණේ මහා කෝසල රජුගේ අගමෙහෙසියක වූ කුමාරිකාවකගේ දායාදය වශයෙනි. කාසී ජනපදයේ අගනගරය බරණැස විය. බරණැස ගංගා නදියේ තොටුපලක් ලෙස ඉතා වැදගත් විය.කපු , සේද , පටපිළි හා වෙනත් නිෂ්පාදන නිසා බරණැස ප්‍රකට විය.**

මෙකල ගංගා නදිය ආශ්‍රිත වෙළෙඳ මාර්ග පාලනය කිරීමේ දී මගධයේ පිහිටීම වාසිදායක තත්ත්වයක නොවී ය. වෙළෙඳ මාර්ග කෙළවර වූ ප්‍රදේශය මහා වනාන්තරවලින් ගහන විය. නමුත් පසුව කෝසලය අභිභවා මගධය බලවත් විය.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එස්.එච්.දිනුෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ


Copyright © www.e-thaksalawa.moe.gov.lk

මගධය බලවත් වීමට හේතු

- දේශපාලන සාධක
- භූ භෞතික සාධක
- ආර්ථික සාධක
- සමාජයීය සාධක

## භූ භෞතික සාධක

ඉන්දියාවේ භූ විෂමතා



අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එස්.එච්.දිනුෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- සරු පසක් තිබීම හා හිතකර දේශගුණයක් තිබීම නිසා දියුණු කෘෂි ආර්ථිකයක් ගොඩනැගීමට හැකිවීම.

- ගංගා නිම්නය ඔස්සේ විහිදුණ දීර්ඝ තැනිතලාව ගමනාගමනයට මෙන්ම විවිධ ආර්ථික කටයුතුවලට වැදගත් වීම.

සින්දු ගඟ හා අතු ගංඟාවන්ගේන් පිටාර ගැලීම නිසා ඇතිවන සරු පස නිසා මේ ප්‍රදේශය සශ්‍රීක විය. තැනිතලාව නිසා වෙනත් කිසිම ප්‍රදේශයකට නැති තරම් මාර්ග පහසුකම් සැලසුනි.

- වේභාර, වේපුල්ල, ගිජ්ජකූට ආදී පංචමහා පර්වත ඇතුළු ස්වාභාවික භූගෝලීය පිහිටීම් රැසක් මඟින් මගධය ආරක්ෂා වී තිබීම.

එසේ ම කඳුවැටිවලින් ගලා එන උණුසුම් හා ශීතල දිය ඇලි නිසා නගරය පිහිටි පෙදෙසේ බාධාවලින් තොර ජල සැපයුම ද සශ්‍රීක බිම් පෙදෙස් වූ හෙයින් ආක්‍රමණයක් වැනි අවස්ථාවක සෑහෙන කලකට ඔරොත්තු දිය හැකි තත්ත්වයක් ද තිබුණි.

- ගංගා යමුනා ඇතුළු අතු ගංඟා රාශියක් තිබීම.

- වැඩිම වර්ෂාපතන ලැබෙන ප්‍රදේශයක් වීම.

මගධයේ වෙළෙඳ මාර්ග කෙළවර මහා වනාන්තරවලින් ගහන විය.පසු කාලයේ දි මගධය අධිරාජ්‍යක් තෙක් විකාශනය වීම එම රාජ්‍යයට හිමි ප්‍රදේශයෙහි වූ ස්වාභාවික සම්පත් බලපා ඇත.
රජගහ නගරය වටකරගෙන තිබූ කඳුවැටි ප්‍රදේශවල යපස් සුලබ විය. ගයාවෙන් ඔබ්බට වූ වගුරු බිම්වල හා වනාන්තරවල යකඩ නිධි බහුල විය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එස්.එච්.දිනුෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## දේශපාලන සාධක

- හර්යංක පරපුරේ බිම්බිසාර , අජාසත්ත වැනි කාර්යශූර උපක්‍රමශීලී පාලකයන් බිහිවීම.
- බිම්බිසාර රජු මගධයේ සේනාබලය සංවිධානාත්මකව ගොඩ නැගූ පසු අජාසත්ත එයට ශිලාකණ්ඨා හා රථමුසල නම් වූ නවීන යුද්ධායුධ එක් කරමින් තවදුරටත් ශක්තිමත් කිරීම.
- ඔවුන් සිය රාජ්‍යය බලවත් කිරීම සඳහා නිරන්තරයෙන් උපක්‍රම යෙදීම.
- මත්ස්‍ය න්‍යාය , විවාහ සබඳතා , මිත්‍ර සබඳතා , ආගමික සබඳතා ආදී විවිධ උපක්‍රම මඟින් රාජ්‍යය පුළුල් කිරීම
- වෙනස් වන දේශපාලන ආර්ථික සමාජයීය තත්ත්වයන්ට සංවේදී වෙමින් අගනුවර වරින් වර මාරු කිරීම.
  ගිරිව්‍රජ ⟶ රාජගෘහ ⟶ පාටලී පුත්‍ර
- දක්ෂ උපදේශක අමාත්‍යවරුන් සිටීම. (සුනීධ , වත්සකාර , කෞටිල්‍ය)

දේශපාලන සාධක පිළිබඳ ව කතා කිරීමේ දී ආරක්ෂක සංවිධානය ඉතා වැදගත් වේ.මුලින් ම ස්ථාවර හමුදාවක් සිටි උතුරු ඉන්දියානු රජු බිම්බිසාර බව සිතීමට සාධක ඇතැයි විද්වත්හු පවසති. මහා වංශයට අනුව බිම්බිසාර පහළොස්වැනි වියේ දී අභිෂේක ලබා ඇත.

- බිම්බිසාර රජුගේ විවාහ සම්බන්ධතා ඔහුගේ තත්ත්වය තහවුරු කිරීමට එක් හේතුවක් විය.
- කෝසලයේ ප්‍රසේනජිත් කෝසල රජුගේ සොහොයුරිය ආවාහ කර ගැනීමේ දී බිම්බිසාර රජුට ලැබුණු දායාදය වූයේ ලක්ෂයක ආදායමක් ලැබෙන කසී ග්‍රාමය යි.
- මධ්‍ය පංජාබයේ මද්‍ර දේශයේ රජුගේ දියණියක වූ ඛේමා බිම්බිසාර රජුගේ IV වන බිසව විය.මේ විවාහ සම්බන්ධතාව ගංගා නිම්නයේ සෙසු රාජ්‍ය අතර කැපී පෙනෙන තත්ත්වයක් හිමිකර ගැනීමට උපකාර විය

**මෙය මගධ රාජ්‍යයේ වර්ධනයට බලපෑවේ ය.**

එසේ ම බිම්බිසාර රජු බ්‍රහ්මදත්ත රජු මරා අංගයේ අගනුවර වූ චම්පානුවර ද අල්ලා ගෙන අජාතශත්‍රු එහි ආණ්ඩුකාරවරයා වශයෙන් පත් කළේය.

ඒ අනුව මගධ රාජ්‍යයට අංග රාජ්‍යය එක් විය.

මේ කාල වකවානුවේ කෝසල හා මගධ රාජ්‍යය අල්ලා ගැනීමේ ව්‍යාප්තියේ යෙදෙමින් බලය තහවුරු කර ගැනීමේ යෙදී සිටිය ද , දෙපස අතර යුද්ධයක් තිබුණේ නැත.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එස්.එච්.දිනුෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

රාජ්‍ය දෙකේ ම රජවරු බුදුන් වහන්සේගේ දායකයෝ වූහ.ජෛන වැනි වෙනත් ආගමික නිකායන්ට ඔවුන්ගෙන් උදව් ලැබුණි. රාජ්‍ය දෙක අතර විවාහ සම්බන්ධතාවක් ද තිබිණි. (කෝසලයේ පසේනදී රජුගේ සොහොයුරිය බිම්බිසාර රජුගේ අග බිසව විය.)

බිම්බිසාරගේ පුත් අජාසත්ත තම පියා සිරකොට මරා දැමීම නිසා රාජ්‍ය දෙක අතර යුද්ධයක් ඇති වීමට හේතු විය. රජුගේ බිසව වූ කෝසල දේවිය ද ශෝකයෙන් මළා ය. අජාසත්තගේ ක්‍රියාවෙන් කුපිත වූ පසේනදී රජතුමා කාසිගාමය ආපසු ගෙන ඇත.

ගංගා නදියේ ඉහළ නිම්නයේ වෙළෙඳ මාර්ග යොමු වී තිබුණු ප්‍රධාන තොටුපල එමඟින් පාලනය කළ හැකි වූ බැවින් මගධයට එය වැදගත් විය.සටන් කීපයක් මෙහෙය වූ අජාසත්ත රජු කාසිගාමය ආපසු අල්ලා ගත්තේ ය.
එසේම මහලු පසේනදී කෝසල රජතුමා මියයෑම නිසා කෝසල ජනපදයට ද හිමිකම් කිව හැකි තත්ත්වයක් උදා විය.

කෝසල රාජ්‍යය පමණක් නොව ලිච්ඡවී , මල්ල වැනි ගණ රාජ්‍යය ද කවදා හෝ මගධයට ඈදා ගත යුතු බව තීරණය කළ අජාසත් රජු ඒ සඳහා ක්‍රමානුකූල ලෙස සූදානම් විය.විශේෂයෙන් ලිච්ඡවී , මල්ල යන ගණ තන්ත්‍රවල පැවැත්ම ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමයේ වර්ධනයට බාධාවකි.

මේ වනවිට ගංගා නදියේ උතුරු ඉවුර තෙක් බලය ව්‍යාප්ත කරගෙන සිටි ලිච්ඡවීහු එහි තොටුපල සියල්ල පාලනය කරමින් බදු එකතු කර ගත්හ.මෙය උතුරේ සිට මගධයට ආ වෙළෙඳුන්ට මෙන් ම , මගධයෙන් උතුරට භාණ්ඩ ප්‍රවාහනය කළ වෙළෙඳුන්ට හිරිහැරයක් විය.මගධ රාජ්‍යය හරහා ගලා ගිය ගංගා නදියේ ඉහළ ඉවුර මෙලෙස ලිච්ඡවි පාලනයට පත්වීම තමන්ට අභියෝගයක් ලෙස සැලකූ අජාසත් රජු සිය යුධ සැලසුම් වඩාත් ක්‍රමානුකූල තත්ත්වයකට ගෙනාවේ ය.

- අජාසත් රජු සප්ත අපරිහානීය ධර්මවලින් ලිච්ඡවීන් ගොඩනගා ගෙන තිබූ සමඟිය බිඳ දැමීමට උපක්‍රම යෙදී ය.
- අජාසත් රජුගේ සුනීධ හා වස්සකාර නම් පුරෝහිත බමුණන් ලිච්ඡවීන් වෙත යවන ලදී.
- මගධ පාලකයාගේ කීර්තිනාමය නිසාදෝ ප්‍රධාන පෙළේ ලිච්ඡවි පවුල් සියල්ල සමඟ මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගැනීමට සුනීධ හා වස්සකාර සමත් විය.
- ලිච්ඡවීන් තුළ එකිනෙකා අභිභවා යන ආශාවක් ඇතිකර ගනිමින් භේදකාරී තත්ත්වයක් මතු කිරීමට ඔවුන් සමත්විය.
- මගධය හා ලිච්ඡවීන් අතර ගැටුමට හේතුව විවිධ මූලාශ්‍රවල විවිධ අයුරින් දක්වා ඇත.
- අජාසත් රජුට ලිච්ඡවීන් පහසුවෙන් දිනීමට නොහැකි වූයේ ඔවුන්ගේ ගණ රාජ්‍යය කුඩා ගණ රාජ්‍යය 36 කින් යුක්ත වූ ප්‍රබල එකක් වූ නිසා ය.



අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එස්.එච්.දිනුෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- **ලිච්ඡවීන් කොතරම් ප්‍රබල වුවත් මම ඔවුන්ගේ ශක්තිය සිඳලමි. " අජාසත් රජු අධිෂ්ඨාන කරගත් බව මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් වේ.**

නමුත් යුද්ධය වඩාත් දුෂ්කර කාර්යයක් වූයේ ලිච්ඡවි ගණ රාජ්‍ය සමූහය ගංගා නදියෙන් උතුරේ පිහිටා තිබීමත් , මගධයේ බලය නදියෙන් දකුණෙන් වූ ප්‍රදේශවලට සීමා වීමත් නිසා ය.

- **දක්ෂ උපදේශන අමාත්‍යවරුන් සිටීම මගධයේ ව්‍යාප්තියට ප්‍රබල හේතුවක් විය.**

සුනීධ , වස්සකාර ඇමතිවරුන් දෙදෙනාගේ අධීක්ෂණය යටතේ පාටලීග්‍රාමය මුල් කරගෙන පාටලීපුත්‍ර නගරය ගොඩනන ලද්දේ එහි සංග්‍රාමික වැදගත්කමක් ඇති තුංමං හන්දියක් වූ හෙයිනි.(ගණ්ඩක් හා සෝණ යන ගංගා පිළිවෙළින් උතුරින් හා ඊසාන දෙසින් ගලාවිත් ගංගා නදියට එක්වූයේ මෙතැන දී ය.)

- **බිම්බිසාර රජු මගධයේ සේනා බලය සංවිධානාත්මක ව ගොඩනැඟූ පසු අජාසත්ත රජු නවීන යුද්ධායුධ එක් කරමින් තව දුරටත් ශක්තිමත් කිරීම.**

පාඨලීපුත්‍ර නගරය ගොඩනගා නිමවූ පසු ලිච්ඡවීන්ට විරුද්ධ ව ප්‍රහාර එල්ල විය.මේ වන විට ලිච්ඡවීන් අතර අසමගිකම් පැතිර තිබිණි.ජෛන මූලාශ්‍රවල යුද්ධය පිළිබඳ විස්තර දක්නට ලැබේ. ඒ අනුව **අජාසත් මහාශීලා කණ්ඨක හෙවත් මහගල් විදින යන්ත්‍රයක් හා රථමුසල හෙවත් සතුරන් මැදට යැවූ කල්හි ඒ මේ අතට කැරකෙමින් මහ විනාශයක් කරන විෂ ඊතල හා වෙනත් ආයුධ බැඳි චක්‍රයක් යන නවීනතම ආයුධ** යුද්ධය සඳහා උපයෝගී කර ගත්තේ ය.
රථමුසලය ක්‍රියාත්මක කරන ලද්දේ ඒ තුළ සැඟ වී සිටින එක පුද්ලයෙකු විසිනි.එය යුද්ධ ටැංකියකට සමාන විය.

- අජාසත් රජු හා ලිච්ඡවීන් අතර සංග්‍රාමය අවුරුදු දහසයක් තිස්සේ පැවති බව ජෛන මූලාශ්‍රය අනුව පෙනේ.

මගධය විසින් කෝසලය දිනා ගනු ලැබීමට මුල් වූයේ අහඹු සිදුවීමකි. එතරම් දූරදර්ශී පාලකයෙකු නොවූ බව පෙනෙන කෝසලයේ විඩූඩභ රජු ශුෂ්ක වාලුකා කාන්තාර පෙදෙසක් වූ රාජතී නදී ඉවුරෙහි හමුදා කඳවුරු බැඳ ගතී. ක්ෂණික ජල ධාරා ගැලීම පිළිබඳ ප්‍රසිද්ධියක් ඇති රාප්තී නදිය පිටාර ගලා මුළු හමුදා කඳවුර ම විනාශයට පත්විය. විඩූඩගේ මරණයෙන් අනතුරු ව කෝසල සිහසුනට හිමිකම් කීමට කෙනෙක් නොවූයෙන් එය නිරායාසයෙන් ම අජාසත්තට හිමි විය.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එස්.එච්.දිනුෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ආර්ථික සාධක

- කෘෂිකර්මාන්තයට හා සත්ත්ව පාලනයට යෝග්‍ය පාරිසරික සාධක රැසක් මගධයේ දක්නට ලැබීම.
- වාණිජ කටයුතු බාහිර හා අභ්‍යන්තර වශයෙන් ව්‍යාප්ත කිරීමට යෝග්‍ය මාර්ග පහසුව වරාය තොටුපල පිහිටා තිබීම.
- යපස් , රන් , මැණික් ඇතුළු වටිනා ඛනිජ සම්පත් රැසක් මගධ රාජ්‍යයට අයත් ව තිබීම.
- මගධය සතු වනාන්තරවලින් ඇව , අලි ඇතුන් ඇතුළු සම්පත් රැසක් ලබා ගත හැකි වීම





මගධය සේනා බලයෙන් පමණක් නොව ධනාඪ්‍ය බවින් ද ශක්තිමත් රාජ්‍යක් වීමේ පදනම වැටුණේ බිම්බිසාර රජුගේ කාලයේ දී ය.

අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එස්.එච්.දිනුෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සමාජීය සාධක

- ගංගා යමුනා ප්‍රදේශය භූගෝලීය වශයෙන් බාධාවක් නොවූ නිසා සමාජ ඒකාබද්ධතාවක් ගොඩනැඟීම.
- වර්ණ ක්‍රමය තදින් ක්‍රියාත්මක නොවීම.
- වෙළෙඳාම විවිධ කර්මාන්ත , කෘෂිකර්මාන්තය වැනි අංශ මගින් ධනවත් වූ ප්‍රජාවක් ( සෙට්ටින්) බිහිවීම.
- මෙම සමාජ පසුබිම ඔස්සේ ම වඩාත් ශක්තිමත් හා පුළුල් දේශපාලන රටාවක් ගොඩනැගීමේ අවශ්‍යතාව පැන නැගීම.
- දේශපාලන බලය ලබා ගැනීමට ක්ෂත්‍රිය පදනම අවශ්‍ය නොවීම.(හර්යංක , සිශුනාග , මෞර්ය , ශුංග යන කිසිදු පාලන වංශයක් ක්ෂත්‍රිය වංශයට අයත් නොවී ය.)
- මගධයේ නැගීමට එහි පැවති නම්‍යශීලී සමාජ ක්‍රමය මහත් සේ බලපෑවේ ය. මෙහි ආර්ය , අනාර්ය සංකලනයක් සිදු විය.
- මුල් අවධියේ සිට ම වෛදික , බ්‍රාහ්මණ ආගමින් ඈත් වූ පිරිසක් මෙම ප්‍රදේශය තුළ ජීවත් වූ ජනතාවගේ ආගමික ජීවිතය වෙනස් අතකට යොමු කළේ ය.
- බෞද්ධ සහ ජෛන ආගම්වල පහළ වීම නිසා මගධයේ ජනතාව තුළ නිදහස් චින්තනයක් බිහි වීමට මග පෑදුණි.
- සමාජ චර්යාධර්ම එතරම් දැඩි නොවූ හෙයින් විවිධ ජාතීන් හා විවිධ කුල මිශ්‍ර වීමෙන් සංස්කෘතික සමාජමය හා දේශපාලන සංස්ථාවල වර්ධනයක් දක්නට ලැබුණි.



අන්තර්ගතය :- එස්. ඒ. එම්. එස්. එන්. සෙනෙවිරත්න මිය , ලක්දාස ද මැල් විද්‍යාලය-කුරුණෑගල
සැකසුම :- එස්.එච්.දිනූෂා හර්ෂණී කරුණාසේන මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂා කිරීම :- ශශිකා හෙට්ටිආරච්චි මෙනෙවිය , සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk